# අම්බලමේ පිනා පිනා





ඇත්තටම අපි පුංචි කාලේ හැම දෙනාම මේ පුංචි කවිය ඉගෙනගෙන තියෙනවා. එය ආසා- වෙන් ගායනා කරලත් තියෙනවා. ඒත් ඒකෙ අන්තර්ගත විද්‍යාත්මක පැත්ත සත්‍යය දන්නෙ ඉතාම අඩු පිරිසක් විය හැකියි. සමහරු මෙය හඳුන්වන්නෙ දහම් ගැටයක් විදියටයි. ඇතුළත අඩංගු වෙලා තිබෙන්නෙ මතුපිටින් කියැවෙන අර්ථය නොවන බැවින්. ඒ නිසා මට හිතුණා එය පහදා දෙන්න.

අම්බලමේ පිනා පිනා
වළං කදක් ගෙනා ගෙනා
ඒක බිඳපු ගොනා ගොනා
ඒකට මට හිනා හිනා

අපි සංසාර චක්‍රයේ සැරිසරන ඉතා දීර්ඝ ගමනේදී එක එක ආත්මවල ඉපදීමත්, ඒ උපදින කොට කුසල අකුසල පොදි බැඳගෙන ඇවිත් ඒවා විඳවන බවත්, ඒක නොදැනගෙන හැම දෙනාම මනු ලොව අම්බලමේ වෙසෙන කල, ගෞතම බුදුරජුන් හෙවත් ගෞතම නා, හෙවත්, ගොනා සියල් සතට දුක් නැති කර ගැනීමේ මාර්ගය දේශනා කළ හෙයින් ඒ නිසා මට සතුටක් හෙවත් හිනාව ලැබීමයි මේ කවියේ මුඛ්‍ය අදහස.ඒත් අපි දන්නේ එහි පදගත අරුත පමණයි. ඒ සාහිත්‍යය අපෙන් ඈත් කළ නිසයි.

♦ ලුතිනන් වසන්ත දේවසිංහ
හතරලියැද්ද මහනුවර
Sri Lanka

# සයිප්‍රසයේ කඨින මහා පෙරහැර

## නොවැම්බර් මස 6 සහ 7 යන දෙදින මෙම මහා පිංකම පැවතියේය

ලෝකවාසි බෞද්ධ ජනතාවගේ සුවිශේෂි වූ පිංකමක් වන කඨින පිංකම බුදුන් වහන්සේ වැඩවිසූ කාලයේ පටන් පැවත එන්නකි. භික්ෂූන් වහන්සේලා ඇසළ පුර පොහොයෙන් වස්වසා තෙමසක් පුරා විහාරස්ථාන තුළ වැඩ වාසය කරමින් පින්කම්හි යෙදෙමින් අර්ථයෙන් ධර්මයෙන් අනුශාසනා ලබා දෙමින් මෙම විනය කර්මය අවසන් කරනුයේ කඨින පිංකමෙනි. අට මහ කුසලයන්ට අයත් මෙම මහා පුණ්‍යෝත්සවය ගමින් ගමට අප මව්බිම පුරා විහාරස්ථානවල පසුගිය දිනවල පැවැත්වූ අතර, විදෙස්ගත ශ්‍රීලාංකිකයෝ ඔවුන් වෙසෙන රටවල විහාරස්ථානයන් හි පවත්වති.

විසිපන්දහකට අධික ශ්‍රී ලාංකික පිරිසක් සේවය කරන සයිප්‍රස් රාජ්‍යයේ ද මෙම වටිනා පුණ්‍යකර්මයට සහභාගි වීමේ වාසනාව අපට උදා කරදෙනු ලැබුයේ සයිප්‍රසයේ ශ්‍රී ලංකාරාම විහාරස්ථානයේ විහාරාධිපති මෙන්ම සයිප්‍රසයේ සංඝනායක මොරවක සෝරත නායකස්වාමීන් වහන්සේගේ අනුශාසකත්වයෙන් විහාරවාසී ශාස්ත්‍රපති පූජ්‍ය පැලැම්පිටයේ මහින්ද ස්වාමීන් වහන්සේගේ සහ පූජ්‍ය කොටවායේ සුසීල ස්වාමීන් වහන්සේගේ ප්‍රධානත්වයෙන් සහ සයිප්‍රස් බෞද්ධ සංගමයේ සංවිධානත්වය විසිනි.

සම්ප්‍රදායානුකූලවම කඨින චීවරය පෙරටු කොටගත් පෙරහැර නැටුම් වැයුම් ඇතුලු අංග රැසකින්ම අලංකාරව කොඩි, සේසත්, මුරායුද සහිතව සයිප්‍රසයේ අගනගරය වන නිකෝසියා හි වීදි සංචාරය කළේ අපේ සංස්කෘතියට හාත්පසින්ම වෙනස් රටක වුවද මහා අභිමානයක් ශ්‍රීලාංකික අපගේ හදවත් තුලට කාවද්දමිනි. බෞද්ධ අබෞද්ධ විශාල පිරිසක් මෙම පෙරහැරට සහභාගි වූ අතර, ඒ සැමදෙනා වෙනුවෙන් පූජ්‍යපාද මොරවක සෝරත ස්වාමීන් වහන්සේ සමග පූජ්‍යපාද සන්නස්ගම බුද්ධප්‍රිය ස්වාමීන් වහන්සේලාගේ සුමධුර වූ යුගාසන කාව්‍යමය දහම් දෙසුමක් ද විය. පූජ්‍ය දෙනිපේ චන්දවිමල ස්වාමීන් වහන්සේ ද මෙම පිංකමට සහභාගි විය. කඨින චීවරය සඟසතුකොට පූජා කිරීමේ පුණ්‍යනොත්සවය ඊට පසුදින නිකෝසියා නගරයේ සීතා උද්‍යානයේ දී අති විශාල පිරිසකගේ සහභාගිත්වයෙන් සිදුවිය. මෙම පිංකමට අතහිත පෑ සැමට පිං සිදුවේවා!

උපන් දේශයෙන් දහක් දුර විත්, පවුලේ අයගෙන් වෙන්වී, දිවරැ නොබලා දුක් මහන්සි වන අපේ විඩාබර හදවත් නිවාලන, අප කෙරෙහි අනුකම්පා සිතින් හා මහත් කැප වීමෙන් කටයුතු කරන ශ්‍රී ලංකාරාමයේ වැඩ වසන ස්වාමීන්වහන්සේලාට නිදුක් නිරෝගී සුව සෙත නිබඳ ප්‍රාර්ථනා කරමු !

සම්බුදු හිමිගෙ ගුණ නිතැතින් සිහි කරලා
දහමට අනුව නිසි කාලයේ වස් වසලා
තෙමසක් ගෙවී වස් කාලය නිමා වෙලා
කඨිනයෙ සුවඳ බැති හදවත් එකලු කලා

වස්සානයේ වත්පිලිවෙත් සමග හිඳ
උදයේ සවස සිව්පසයෙන් පුදන ලද
පිදුහැම දෙනා අනුමෝදන් රසය විඳ
අද සැනහේය නොරටක දම් රසය මැද

පිංකම් වලින් අග තැන්පත් කඨින යට
අතවැල් බැඳන් එක්වී පිං කරන් නට
යන්නට නැතත් ඔසවා ගෙන ගෙයින් ගෙට
වැන්දා බැති සිතින් සැම අත් මුදුන් කොට

♦ විමලා යාපා - සයිප්‍රස් Cyprus


Duke's Court Travel
DUKE'S COURT TRAVEL Travel Management

Fly to Colombo

| | | |
|---|---|---|
| SriLankan | SriLankan Airlines | fr £405 + Taxes |
| QATAR AIRWAYS | Qatar Airways | fr £289 + Taxes |
| KUWAIT AIRWAYS | Kuwait Airways | fr £260 + Taxes |
| Emirates | Emirates | fr £430 + Taxes |
| ETIHAD | Etihad Airways | fr £245 + Taxes |
| OMAN AIR | Oman Air | fr £185 + Taxes |
| JET AIRWAYS | Jet Airways | fr £260 + Taxes |

Note: All fares mentioned are low season / terms & conditions apply.

020 8748 3535

3045 ATOL PROTECTED · AITO THE ASSOCIATION OF INDEPENDENT TOUR OPERATORS · IATA

204 King Street, London W6 0RA


## සතර වර්ෂ පූර්ණ සිහිකිරීමයි!

## වජිරඥාණ නායක ස්වාමීන් වහන්සේ

ලන්ඩන් බෞද්ධ විහාරයේ විහාරාධිපතිව වැඩවිසූ පූජ්‍ය ආචාර්ය මැදගම වජිරඥාණ නායක හිමියන් අපවත්වී සිව් වසරක් පිරීම නිමිත්තෙන්



ලන්ඩන් බෞද්ධ විහාරයේ දී 2010 දෙසැම්බර් 15 වෙනි දින විශේෂ පිංකමක් පැවැත්වේ.

උදේ 11.00 බුද්ධ පූජාව
11. 15 සාංඝික දානය
12. 30 සෙත් පිරිත් සහ පුණ්‍යානුමෝදනා
1. 00 ගිහි අයට සංග්‍රහ

මෙම පිංකමට සුපින්වත් ඔබ සැමගේ සහභාගිත්වය අපේක්ෂා කෙරේ.

**වජිරඥාණ නාහිමියන්ට නිවන් සුව පතමු!**


මේ උත්සව සමයේ FASTCASH වෙතින් ගණුදෙනුකාර ඔබ සැමට විශේෂ වූ දීමනාවක්!

එන්න... අප සමඟ එකතු වී ඔබගේ මුදල් නොමිලේ ශ්‍රී ලංකාවට යවන්න.

ඔබගේ මිතුරාට අපගේ FASTCASH සේවය හඳුන්වා දීමෙන්, ඔබත් මිතුරාත් දෙදෙනාම මෙම විශේෂ දීමනාවට හිමිකරුවන් වන්න.

FAST CASH SEND TODAY - COLLECT TODAY

* කොමර්ෂල්, හැටන් නැෂනල් සහ ලංකා බැංකු සමග එක්ව, දිවයින පුරා 500කට අධික ශාඛා ජාලයකින් එදිනම මුදල් ලබාගැනීමේ පහසුව
* ලංකාවේ ඕනෑම බැංකු ගිණුමකට මුදල් ක්ෂණිකව බැර කිරීම
* ඔබගේ NRFC / RFC විදේශ ගිණුම් වලට මුදල් බැර කිරීම
* රටවල් 120කට මුදල් යැවීමේ පහසුව
* ඔබගේ මුදල් මැද පෙරදිග අතරමැදියන් වෙත නොයා ක්ෂණිකව හා සෘජුවම ගිණුමට බැර කිරීමේ විශ්වාසය

COMMERCIAL BANK · BOC BANK OF CEYLON · HNB · SEYLAN BANK · NSB · HSBC · PEOPLE'S BANK · SampathBank · NDB bank · Standard Chartered

Transfer Fees From only £5

020 8886 4488

Fastcash Financial Services Ltd
125-127 Bramley Road, Oakwood, London, N14 4UT
www.efastcash.biz

Trading Hours Open 7 days
Mon-Fri 9.00am-6.00pm
Sat - 9.30am-5.30pm
Sun- 10.00am-4.00pm

Strong. Safe. Reliable. MCG Mike Cooke Group


